# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

**අංක 1863/29 – 2014 මැයි 23 වැනි සිකුරාදා – 2014.05.23**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# III වැනි කොටස – ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

38 වැනි වගන්තිය (අ) අතුරු විධානය යටතේ ආඥාව

**2014 අංක 110 දරන ආඥාව**

මගේ යොමු අංකය: 4-3/9/2013/අයිආර්/680.
ප්‍රාදේශීය ලේකම්ගේ යොමු අංකය: 3/5/ඩීඕ/පි/නැ/ප/3.

ඉඩම් අත්කර ගැනීමේ පනතේ (460 වැනි පරිච්ඡේදය) 38 වැනි වගන්තියේ (අ) අතුරු විධානයෙන් මා වෙත පවරා ඇති බලතල අනුව, ඉඩම් සහ ඉඩම් සංවර්ධන අමාත්‍ය ජනක බණ්ඩාර තෙන්නකෝන් වන මම, පහත සඳහන් උපලේඛනයේ 1 වැනි ජේදයේ සඳහන් ඉඩම් අත්කර ගැනීමේ නිලධාරියාට නැතහොත්, එකී නිලධාරියා විසින් ඒ සඳහා බලය දෙන ලද වෙනත් නිලධාරියෙකුට, එම උපලේඛනයේ 2 වැනි ජේදයේ දැක්වෙන නියමිත ඉඩම ස්වාමිත්වයට ගැනීමට මෙයින් නියම කරමි.

ජනක බණ්ඩාර තෙන්නකෝන්,
ඉඩම් සහ ඉඩම් සංවර්ධන අමාත්‍ය.

2014 මැයි මස 22 වැනි දින,
ඉඩම් සහ ඉඩම් සංවර්ධන අමාත්‍යාංශය,
'මිහිකත මැදුර',
අංක 1200/6, රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.

උපලේඛනය

1. **ඉඩම් අත්කර ගැනීමේ නිලධාරියා –** ප්‍රාදේශීය ලේකම්, ගනේවත්ත.

2. **ඉඩමේ විස්තරය.–** වයඹ පළාතේ, කුරුණෑගල දිස්ත්‍රික්කයේ, ගනේවත්ත ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, මහගල්බොඩ එගොඩ කෝරළේ සුළු කොට්ඨාසයේ, අංක 452 නැලව ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ, නැලව (අ.ග.පි. 1359) ගමේ පිහිටි සර්වේයර් ජනරාල් විසින් පිළියෙල කරන ලද අංක කේයු/ජීඑන්ඩබ්/2014/138 සහ 2014.04.22 දිනැති ප්‍රගමන අනුරේඛනයේ සවිස්තරව දැක්වෙන ප්‍රමාණයෙන් හෙක්. 4.4516 ක් පමණ වන පින්වත්තහේන නොහොත් ගැටකුලලන්ද වත්ත නමැති ඉඩම් කොටස් දෙක (02)ට මායිම්:

01. **කැබලි අක්ෂර 'ඒ' – පින්වත්තහේන නොහොත් ගැටකුලලන්ද වත්ත – ප්‍රමාණය: හෙක්. 2.0764 ක් පමණ**

උතුරට: නැලව වැව; නැගෙනහිරට: එච්. එම්. හේරත්බංඩා සහ තවත් අය හිමිකම් කියන ඉඩම; දකුණට: ප්‍රාදේශීය සභා මාර්ගය; බටහිරට: ටී. එම්. කිරිමුදියන්සේ සහ තවත් අය හිමිකම් කියන ඉඩම.

02. **කැබලි අක්ෂර 'බී' – පින්වත්තහේන නොහොත් ගැටකුලලන්ද වත්ත – ප්‍රමාණය: හෙක්. 2.3752 ක් පමණ**

උතුරට: ප්‍රාදේශීය සභා මාර්ගය; නැගෙනහිරට: ප්‍රාදේශීය සභා මාර්ගය සහ පීටර් වැලිවත්ත; දකුණට: පීටර් වැලිවත්ත, චන්ද්‍රා ජයසේකර සහ තවත් අය හිමිකම් කියන ඉඩම; බටහිරට: චන්ද්‍රා ජයසේකර සහ තවත් අය හිමිකම් කියන ඉඩම.

06 – 178

1A – G19587 – 90 (2014/05) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*